**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2025.12.10 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2025 දෙසැම්බර් මස 10 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති | - | එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.නිර්මික දීපාල් අබේවර්ධන මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.චන්ද්‍රලාල් මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | ඩබ්.එම්. ශ්‍රියානි වීරසේකර මැතිතුමිය. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.ඉන්දික කුමාර මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එච්.ඥානලතා හපුතන්ත්‍රි මැතිතුමිය |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | ටී. ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එම්.ප්‍රදීපා ඉඳුමිණී කුලරත්න මැතිතුමිය. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ජෙහාන් මෝහන් මැතිතුමා. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඩබ්.මොහාන් මංජුල මැතිතුමා |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති තුමා, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ස්වාභාවික ව්‍යසනයෙන් පීඩාවට පත්,මරණයට පත්වූ අපේ රටේ පුරවැසියන් වෙනුවෙන් විනාඩියක නිශ්ශබ්දතාවයක් පල කරන ලදි.

**01.පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.(2025.11.12)**

2025.11.12 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ පසුගිය සභාවාරයේදී අප අයවැය කෙටුම්පතට විරුද්ධව අදහස් ප්‍රකාශ කර ඇත.පසුගිය වර්ෂ වලදී අයවැය කෙටුම්පතක් ඉදිරිපත් කරනු ලබන්නේ විශේෂ සභා වාරයක් කැඳවා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර,අයවැය යෝජනා ඉදිරිපත් කළ යුතු බවයි.නමුත් රීති වලට පටහැනිව කටයුතු කර ඇති බවයි.මෙම රීති වලට අනුව ඒකාබද්ධ කාරක සභාවක් කැඳවා අයවැයට යෝජනා ඉදිරිපත් කළ යුතු බවයි.මේ අනුව ඒකාබද්ධ කාරක සභාවක් කැඳවීමකින් තොරව අයවැය කෙටුම්පත ඉදිරිපත් කර ඇති බවයි.ඒ අනුව අයවැය කෙටුම්පත අයවැය ලෙස සම්බන්ධ කර අනුමත කරනවානම් ඒකාබද්ධ කාරක සභා වාර්තාවක් තිබිය යුතු බවයි.තවද මෙම ප්‍රාදේශීය සභා ඉතිහාසය තුළ අයවැයක් සම්මත වූ පසු බැනර් එකක් ප්‍රදර්ශනය කිරීමක් සිදු කළ ප්‍රථම අවස්ථාව බවයි.පසුගිය කාලවලදී අයවැය සම්මත වූ අවස්ථා තිබුණ බවත් ඒ සඳහා පක්ෂව මෙන්ම විපක්ෂවද අදහස් ඉදිරිපත් වූ බවයි.විධිමත් දිනයක අයවැය ඉදිරිපත් කර සම්මත කර ගත යුතු බවයි.නමුත් මෙම රීති උල්ලංඝනය කර කටයුතු කිරීම පිළිබඳ බලවත් අප්‍රසාදය පල කරන බවයි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ අයවැය කෙටුම්පත මහා සභාවේ ඉදිරිපත් කළ බවත්,අයවැය කෙටුම්පත ඉදිරිපත් කළ සැනින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා හා විපක්ෂ මන්ත්‍රීවරුන් මෙම අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් බෙදීමක් අවශ්‍ය බවයි.ඒ අවස්ථාවේදී මහා සභාව කාරක සභාවක් බවට පත් කර අයවැය සම්බන්ධයෙන් ගැටළු ඇත්නම් නිරාකරණය කර ගත් බවයි.

එම අවස්ථාවේදී කිසිම සංශෝධනයක් ඉදිරිපත් නොකළ බවයි.සංශෝධන ඉදිරිපත් නොකළ හෙයින් අයවැය සම්මත කළ බවයි.පක්ෂව හා විපක්ෂව ඡන්දය ලබා දී අයවැය සම්මත කළ බව ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසා සිටියේ මෙම අයවැය සම්බන්ධයෙන් අවස්ථා දෙකක සාකච්ඡා සිදු කළ බවත් ගරු පාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා මෙම සාකච්ඡා වලට සම්බන්ධ නොවූ

බවයි.සියලු මන්ත්‍රී වරුන් සඳහා දෙවන රැස්වීම එනම් ඒකාබද්ධ කාරක සභාව 2025.10.08 වන දින මහා සභාව අවසන් වූ පසු ප.ව.2.50ට පැවැත්වූ බවයි. කෙටුම්පත පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් එහි වගන්ති පිළිබඳ, ප්‍රතිපාදන තත්වය,වැය ශීර්ෂ පිළිබඳ එම රැස්වීම් වලදී සාකච්ඡාවට බඳුන් වූ බවයි.ඉන් අනතුරුව අයවැය කෙටුම්පත අනුමත කිරීමට මහා සභාවට ඉදිරිපත් කල බවත් ඒ සඳහා කිසිදු සංශෝධනයක් ඉදිරිපත් නොකළ බවයි.පොදුවේ අදහස් දැක්වීමක් පමණක් සිදු වූ බවයි. අයවැය කෙටුම්පත පිළිබඳ සංශෝධනයක් නොමැති බැවින් අයවැය අනුමත කිරීම සඳහා යෝජනාව ඉදිරිපත් කළ පසු බෙදීමක් අවශ්‍ය බව ඉල්ලීමක් කළ හෙයින් ඡන්ද විමසීමකට යොමු වූ බවයි.ඒ අනුව අයවැය සම්මත විය.මෙම අයවැය නීත්‍යානුකූල ලෙස සම්මත වූ විධිමත් අයවැයක් බවත්ය.එම හේතුව නිසා නැවත මෙම අයවැය සම්බන්ධයෙන් සභාව තුල කතා කිරීම අවශ්‍ය නොමැති බවයි.

02. **සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.ජී.සචිනි සෙව්වන්දි මැතිතුමිය විසින් 2025.11.14 හා2025.12.05 දිනැති ලිපි මඟින් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභික ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇති බව පවසන ලදි.

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

වෛද්‍යාය හේතූන් මත සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී මයූරි චතුරිකා පරණමාන්න මැතිතුමිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.තිශෝක් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.ශාන්ත පුෂ්පකුමාර කුඩාවත්ත මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

වෛද්‍යාය හේතූන් මත සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ධනේෂ් කුමරන් මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.ඉන්දික උදයකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**04.ගරු සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

වැලිමළුව දොඩම්ගහ ඇළ ආශ්‍රිත ජනතාව විසින් 2025.12.05 වන දින ගංවතුර ආපදා තත්වය අවම කර ගැනීම මැයෙන් වැලිමළුව දොඩම්ගහ ඇළ ආශ්‍රිතව පවුල් 30ක් පමණ ජීවත් වන අතර අධික වර්ෂාව පවතින විට දොඩම්ගහ ඇළ පිටාර ගැලීම නිසා නිවාස 20ක් පමණ ඉක්මනින් ජලයෙන් යටවේ.මීට ප්‍රධාන හේතුව වී ඇත්තේ අවිධිමත් ඉදි කිරීම් හා අවිධිමත් ඉඩම් ගොඩ කිරීමය.එසේම වැලිමළුව අක්කර 50 මාර්ගය ආසන්න ගුණතිලක මහතාගේ කඩය අසළ දොළ මැද ඇති විශාල ගල හේතුවෙන් ඇලේ ජලය ඉක්මනින් බැස යාමට බාධා සිදුවේ.ඇළ ගලන අවස්ථා වලදී මෙම ගල හේතුවෙන් ජලය බැස යාම අවහිර වී ඉහළ ප්‍රදේශ වල ජලය පිටාර යාම සිදුවේ.මෙම ගල හේතුවෙන් ඇළේ ඇති බාධාකාරී ගල කඩා ඉවත් කළහොත් ජලය බැස යාමට ඇති අවහිරතා අවම වී ගංවතුර තත්වය පාලනය වනු ඇත.ඉදිරියට ඇති විය හැකි අවධානම අවම කර ගැනිම සඳහා මෙය පරීක්ෂා කර බලා බාධාකාරී ගල ඉවත් කර දෙන ලෙස ඉල්ලා සිදු කල ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදි.

**05.යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න -නැත**

**06.යථා පරිදී කල් දී ඇති යෝජනා**

**<u>I.ගරු සභාපති එම්.ජී.ඒ. ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.</u>**

01.2026 වර්ෂය වෙනුවෙන් මහා සභා රැස්වීම් පැවැත්වීම සඳහා සෑම මසකම දෙවන සතියේ බදාදා දිනය සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 01</u>**

2026 වර්ෂය වෙනුවෙන් මහා සභා රැස්වීම් පැවැත්වීම සඳහා සෑම මසකම දෙවන සතියේ බදාදා දිනය සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

02.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ පාරිසරික අභ්‍යන්තර ප්‍රතිපත්තිය අනුමැතිය සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 02</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ පාරිසරික අභ්‍යන්තර ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ පාරිසරික අභ්‍යන්තර ප්‍රතිපත්තිය සභා සම්මත විය.

03.පැල්මඩුල්ල බල ප්‍රදේශයේ අවිධිමත් ජනාවාස නියාමනය කිරීම සඳහා අනුගමනය කරන ලද අභ්‍යන්තර ප්‍රතිපත්තිය අනුමැතිය සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 03</u>**

පැල්මඩුල්ල බල ප්‍රදේශයේ අවිධිමත් ජනාවාස නියාමනය කිරීම සඳහා අනුගමනය කරන ලද අභ්‍යන්තර ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව පැල්මඩුල්ල බල ප්‍රදේශයේ අවිධිමත් ජනාවාස නියාමනය කිරීම සඳහා අනුගමනය කරන ලද අභ්‍යන්තර ප්‍රතිපත්තිය සභා සම්මත විය.

04.2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසා සිටියේ ලබන වසරේ සැලැස්මවල් සකස් කිරීම සඳහා අවබෝධයක් ලබා ගැනීමට සංශෝධන ඉදිරිපත් කිරීමට පොඩි කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ ලබන වසරේ සැලැස්මවල් හා ප්‍රතිපත්ති අනුමත කිරීමට කාලයක් ලබා දෙන ලෙසයි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසා සිටියේ අනුමත කිරීම සුදුසු බවත්,ඉදිරියේදී සංශෝධනයන් ඉදිරිපත් කළ හැකි බවයි.

**<u>තීරණ අංක 04</u>**

2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව 2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සභා සම්මත විය.

05.2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද වාර්ෂික පුහුණු සැලැස්ම (මානව සම්පත් සංවර්ධන සැලැස්ම) අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 05</u>**

2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද වාර්ෂික පුහුණු සැලැස්ම (මානව සම්පත් සංවර්ධන සැලැස්ම) සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව 2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද වාර්ෂික පුහුණු සැලැස්ම (මානව සම්පත් සංවර්ධන සැලැස්ම) සභා සම්මත විය.

06.2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 06</u>**

2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව 2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම සභා සම්මත විය.

07.2025 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සඳහා පත්කර ඇති පහත භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වෙත බලය පැවරීමට යෝජනා කරමි.

1. සභාපති - ටී.එම්.වී.එස්.තෙන්නකෝන් මිය
2. සාමාජික - ජේ.එම්.එස්.කේ.බණ්ඩාර මයා
3. සාමාජික - ඩී.ජේ.අයි.කේ.ජයතුංග මිය
4. සාමාජික - ජේ.ඩී.එන්.චන්දිමා මිය
5. සාමාජික - එස්.රත්නාවතී මෙය
6. සාමාජික - කේ.ජේ.උපනන්ද මයා
7. සාමාජික - ඒ.බී.එස්.සේනාරත්න මිය
8. සාමාජික - ඩබ්.එම්.ටී.හර්ෂණී මිය
9. සාමාජික - බී.කේ.ඩබ්.එස්.විජේලතා මිය
10. සාමාජික - ඩබ්.ඩී.ආර්.විජේරත්න මිය
11. සාමාජික - ආර්.ඒ.ඩී.බී.රණසිංහ මිය
12. සාමාජික - ආර්.ඒ.ඩී.ආර්.රණසිංහ මිය
13. සාමාජික - බී.එම්.එන්.පී.ගුණතිලක මිය
14. සාමාජික - කේ.එච්.ජේ.ජයසිංහ මිය
15. සාමාජික - එච්.කේ.ආර්.සොයිසා මිය
16. සාමාජික - එම්.බී.වයි.නිමේෂිකා මිය
17. සාමාජික - කේ.එම්.ඩී.එස්.සෙනෙවිරත්න මිය
18. සාමාජික - එම්.වී.ඒ.පුෂ්පසූරිය මිය
19. සාමාජික - එම්.ඒ.ෂමිලා කුමාරි මිය
20. සාමාජික - බී.එම්.එස්.අයි.යෝගරත්න මයා
21. සාමාජික - එච්.ජයසිංහ මයා
22. සාමාජික - කේ.එම්.එන්.ගුණරත්න මිය
23. අධීක්ෂණ නිලධාරි - එම්.පී.එස්.මල්ලිකා මිය (ප්‍රජා සංවර්ධන නිලධාරී - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය)

    ගරු මන්ත්‍රීවරුන් තිදෙනෙක්

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ඉහත කමිටුව සඳහා පත්කරන ගරු මන්ත්‍රීවරු ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමන්,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමන්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමන් සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07</u>**

2025 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සඳහා ගරු මන්ත්‍රීවරුන් තිදෙනා ඇතුළු පත්කර ඇති ඉහත භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වෙත බලය පැවරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

08.2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද ආපදා සැලැස්ම අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 08</u>**

2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද ආපදා සැලැස්ම සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව 2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද ආපදා සැලැස්ම සභා සම්මත විය.

09.2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 09</u>**

2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන සැලැස්ම සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව 2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන සැලැස්ම සභා සම්මත විය

10.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ඝණ අපද්‍රව්‍ය සැලැස්ම (2026-2030) අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 10</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ඝණ අපද්‍රව්‍ය සැලැස්ම (2026-2030) සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ඝණ අපද්‍රව්‍ය සැලැස්ම (2026-2030) සභා සම්මත විය.

11.2026 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු සැලැස්ම අනුමැතිය හා කාර්තු හතරට අදාළ විගණන කළමනාකරණ කමිටු පැවැත්වෙන දින වශයෙන් 2026.03.25, 2026.06.24, 2026.09.23, 2026.12.16 යන දිනයන් නම් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 11</u>**

2026 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව 2026 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු සැලැස්ම හා කාර්තු හතරට අදාළ විගණන කළමනාකරණ කමිටු පැවැත්වෙන දින වශයෙන් 2026.03.25, 2026.06.24, 2026.09.23, 2026.12.16 යන දිනයන් නම් කිරීම සුදුසු බවට සභා සම්මත විය.

12.2026 වර්ෂයට ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර ඇති සැපයුම්කරුවන් ලියාපදිංචි සැපයුම්කරුවන් ලෙස පිළිගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 12</u>**

2026 වර්ෂයට ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර ඇති සැපයුම්කරුවන් ලියාපදිංචි සැපයුම්කරුවන් සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව 2026 වර්ෂයට ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර ඇති සැපයුම්කරුවන් ලියාපදිංචි සැපයුම්කරුවන් ලෙස පිළිගැනීම සභා සම්මත විය.

13.රජයේ සේවාවන් සඳහා ඩිජිටල් ගණුදෙනු පහසු කිරීම සඳහා නිර්මාණය කර ඇති මාර්ගගත ගෙවීම් වේදිකාවක් වන GovPay පහසුකම ලබා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 13</u>**

රජයේ සේවාවන් සඳහා ඩිජිටල් ගණුදෙනු පහසු කිරීම සඳහා GovPay පහසුකම ලබා ගැනීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

14. පොරෝණුව පාර ,බතලකොටුව දරණ ස්ථානයේ අසේල කතළුව ලියනගේ යන අය විසින් ඉදිකර ඇති අවදානම් තාප්පය වෙනුවෙන් නීත්‍යානුකූල කටයුතු වෙනුවෙන් නීතිඥ තරිදු ඇරැව්වල මහතා හට රු.47,500.00ක නීතිඥ ගාස්තු ගෙවීම සඳහා අනුමැතියට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 14</u>**

පොරෝණුව පාර ,බතලකොටුව දරණ ස්ථානයේ අසේල කතළුව ලියනගේ යන අය විසින් ඉදිකර ඇති අවදානම් තාප්පය වෙනුවෙන් නීත්‍යානුකූල කටයුතු වෙනුවෙන් නීතීඥ තරිදු ඇරැව්වල මහතා හට රු.47,500.00ක නීතීඥ ගාස්තු ගෙවීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

15. 2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද වැසි ජල කාණු නඩත්තුව, මාර්ග පද්ධතිය නඩත්තු කිරීමේ සැලැස්ම අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 15</u>**

2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද වැසි ජල කාණු නඩත්තුව, මාර්ග පද්ධතිය නඩත්තු කිරීමේ සැලැස්ම සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව 2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද වැසි ජල කාණු නඩත්තුව, මාර්ග පද්ධතිය නඩත්තු කිරීමේ සැලැස්ම සභා සම්මත විය.

16. 2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද සුසාන භූමි නඩත්තු සැලැස්ම අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසා සිටියේ සුසාන භූමි නඩත්තු කිරීමේදී අදාළ මරණාධාර සමිතියද සම්බන්ධ කර ගත යුතු බවයි.සුසාන භූමි අවට ජීවත්වන ජනතාව මෙම සුසාන භූමි අල්ලාගන්නා බවයි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසා සිටියේ මෙම සුසාන භූමි පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීම සඳහා මන්ත්‍රීවරුන්ගෙන් යුත් කමිටුවක් පත් කර ඇති බවයි.එවිට සෑම ගරු

මන්ත්‍රීතුමෙකුටම මන්ත්‍රීතුමියකටම පුළුවන් තමන්ගේ බල ප්‍රදේශයේ තිබෙන සුසානභූමි ආරක්ෂා කර ගැනීම සඳහා කටයුතු කළ හැකි බවයි.

**<u>තීරණ අංක 16</u>**

2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද සුසාන භූමි නඩත්තු සැලැස්ම සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව 2026 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද සුසාන භූමි නඩත්තු සැලැස්ම සභා සම්මත විය.

17. පැල්මඩුල්ල බල ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ අභ්‍යන්තර ප්‍රතිපත්තිය අනුමැතිය සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 17</u>**

පැල්මඩුල්ල බල ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ අභ්‍යන්තර ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව පැල්මඩුල්ල බල ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ අභ්‍යන්තර ප්‍රතිපත්තිය සභා සම්මත විය.

18.පැල්මඩුල්ල බල ප්‍රදේශයේ ආබාධිත අය සඳහා වූ අභ්‍යන්තර ප්‍රතිපත්තිය අනුමැතිය සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 18</u>**

පැල්මඩුල්ල බල ප්‍රදේශයේ ආබාධිත අය සඳහා වූ අභ්‍යන්තර ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඉදිරියේදී යම් සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත් එම සංශෝධනයන් වලට යටත්ව පැල්මඩුල්ල බල ප්‍රදේශයේ ආබාධිත අය සඳහා වූ අභ්‍යන්තර ප්‍රතිපත්තිය සභා සම්මත විය.

19. පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ දෛනික පදනම මත සේවයේ යෙදී සිටින පහත නම් සඳහන් නිලධාරීන් 2026.01.01 සිට 2026.12.31 දක්වා වසරක කාලයක් සඳහා සේවා ගිවිසුම දීර්ඝ කිරීම සුදුසු බව යෝජනා කරමි.

1.එම් .අනිල් උදයරාජ් මයා - රියදුරු
2.අනුර ද සිල්වා මයා - සෞඛ්‍ය කම්කරු
3.එච්.ඩබ්.මංජුල විජේදීර මයා - මුරකරු
4.එච්.වසන්තා මිය - සෞඛ්‍ය කම්කරු

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 19</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ දෛනික පදනම මත සේවයේ යෙදී සිටින පහත නම් සඳහන් නිලධාරීන් 2026.01.01 සිට 2026.12.31 දක්වා වසරක කාලයක් සඳහා සේවා ගිවිසුම දීර්ඝ කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

1.එම් .අනිල් උදයරාජ් මයා - රියදුරු
2.අනුර ද සිල්වා මයා - සෞඛ්‍ය කම්කරු
3.එච්.ඩබ්.මංජුල විජේදීර මයා - මුරකරු
4.එච්.වසන්තා මිය - සෞඛ්‍ය කම්කරු

20. බලපත්‍රධාරී ඩබ්.බී.එම් හිරුණි නවෝද්‍යා බස්නායක මියට අයත් පතලෙන් ගල්ලෙපිට ආදාහනාගාරය පිහිටි ඉඩමට කණින ලද දෝනාවෙන් හමු වූ මැණික් ඛණිජ පාෂාණ සම්බන්ධව ඉදිරි කටයුතු කිරීම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කිරීම.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ මෙම කාර්යයෙන් මාව නිදහස් කර දෙන ලෙසයි.පතල් කැපීමට මූලික හේතුව වී ඇත්තේ එතන තිබූ ප්‍රාදේශීය සභා ළිඳෙහි මැණික් ගැරීමයි.සිලින්ඩර් බැස්සූ ළිඳෙහි වතුර සිඳුන පසු නැවත ළිඳක් කැපූ බවත්, එයට සිලින්ඩර නොදැමූ බවත් එම ළිඳ වතුර ගැනීමට පමණක් නොවන බවත්ය.මෙහි මැණික් ගැරීම දිගටම සිදු වන අතර වාර කිහිපයකදීම මෙම ක්‍රියාවලිය සම්බන්ධව මහා සභාවේදී සාකච්ඡා කළ අවස්ථාවේ එවක ගරු සභාපතිතුමන් පවසා සිටියේ එසේ ක්‍රියාවලියක් සිදුවනවානම් අල්ලා දෙන ලෙසය. ඒ අල්ලන අවස්ථාවේ සභාවේ බඩු බාහිරාදිය එහි තිබූ බවයි. ලිඛිත පැමිණිල්ලක් ලෙස මංජුල දසනායක හා සාක්ෂි ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා නම් කර ඇති බවයි.එම ලිඛිත පැමිණිල්ල බැලීමට පුළුවන් බවත් සඳහන් කරන ලදි.මැණික් හමු වූ බව යම් යම් ව්‍යාපාරිකයින් දැන ගත් බවත් ඔවුන් පතල් බැස්ස බවත් එහි දෝනා ආදාහනාගාර ඉඩමට ඇතුලත් වූ බවයි.දෝනා ගිය බව දැනගත් පසු ඉල්ලම් ගොඩගත්ත තමන්ගේ අභිමතය පරිදී ඉල්ලම් ගැරුවා, අභිමතය පරිදී මැණික් තැන්පත් කළ බවත් දැන් ඒ මැණික් වටිනාකමින් 20%ක් අප සභාවට ලැබෙන බවය.මේ මැණික් පුද්ගලයෙකු අතෙහි තිබෙන බවත්, මෙම කාර්යය ඉක්මනින් ඉවර කරන ලෙස ගරු සභාපතිතුමාගේ අත්සනින් ලිපියක් යොමු කර ඇති බවත් සඳහන් කරන ලදි.

ඉන් අනතුරුව තොරතුරු පැහැදිලි කිරීමෙන් පසුව එම මැණික් නැවත වරක් මුද්‍රා තබා විධිමත් පරීක්ෂණයක් සිදු කර වෙන්දේසි කිරීමට තීරණය කළ බවය.සැක කරන පරිදී මෙම කාරණය හේතු කොටගෙන මාව අනතුරකට පත් කළ බවත් එදා කිසිදු හානියක් සිදු නොවූ බවත් දවස් තුනකට පසුව දරුවා අනතුරකට පත් කළ බවත් ප්‍රකාශ කරන ලදි. මේ වනතුරුත් එම අනතුර හේතුවෙන් දරුවාට වෙදකම් කරන බවත්ය.එම නිසා මෙම කාර්යයෙන් ඉවත් කරන ලෙසත්,ලිඛිත පැමිණිල්ල නොදෙන බවත් පවසන ලදි.මේ සිදුවීම නිවැරදි ක්‍රියාවලියකට සිදු කළහොත් ගරු සභාපතිතුමන් විශ්වාස කරන ඉහළ නිලධාරීන් පවා මෙම සිද්ධියේදී වග උත්තරකරුවන් වන බවය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා මෙම කාර්යයෙන් ඉවත් වුවත් මා මෙම කාර්යයෙන් ඉවත් නොවන බවයි.ජාතික ජන බලවේග රජය නීතිය ක්‍රියාත්මක කරන බවත් යුක්තිය සාධාරණය යට කිරීමට ඉඩ නොදෙන බවය.ඔබතුමා බලාපොරොත්තු වූ සාධාරණය ඉටු කරන බවත් පවසන ලදි.පතලේ ගරන අවස්ථාවේ සභාවේ ඉනිමඟ,වතුර මෝටරය සඳහා විදුලිය ලබා ගෙන තිබුනේ ආදාහනාගාරයෙන් බවත් ඒ අවස්ථාවේ එම ගෘහයේ ඉබ්බන් කඩා නොමැති බවත්,ඒවාට සාක්ෂි තුබූ බවත්,ගොඩට ගත් ඉල්ලම් ගෙන ගොස් ඇති බවත් මේ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක නොවූ බවයි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා පවසා සිටියේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් සභාපතිතුමන් මෙම කාර්යය ඉක්මනින් අවසන් කරන ලෙස ලිපියක් ඉදිරිපත් කර ඇති බව පැහැදිළිවම ප්‍රකාශ කළ බවත්,ලිපියේ එසේ සඳහනක් නොමැති බවත් එය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂකගේ වැරදි වැටහීමක් බවයි.එම ලිපියෙන් මේ සම්බන්ධයෙන් නෛතික පියවර ගන්නා ලෙස එම ලිපියේ සඳහන් වූ බවත් මැණික් ගැරීමක් සිදු වුවහොත් එම මැණික්, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය භාරයේ තැබිය යුතුයි යන්න මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතෙහි සඳහන් වුවත් එම ක්‍රියාවලිය මේ සම්බන්ධයෙන් සිදු වී නොමැති බවත්,එය නීති විරෝධි ක්‍රියාවක් බවයි.එම මැණික් පෙට්ටි විවෘත කළේ නොමැති බවත්,එම පෙට්ටියේ මැණික් තිබෙනවාද යන්න නොදන්නා බවත්,එම අවස්ථාවේදි මැණික් වෙන්දේසි කරන බවට තීරණයක් නොගත් බවත් ,එතනදී තීරණය වූයේ මෙම මැණික් එය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය භාරයේ තබාගෙන නිසි නීතිමය පියවර යටතේ ක්‍රියාමාර්ග ගැනීම සිදු කරන බවයි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ ආදාහනාගාර ඉඩමට දෝනාවක් ඇවිත් මැණික් ගැරීම වරදක් බවත්,ඉල්ලම් ටික අරගෙන මැණික් ගරන්න තීරණය කර මැණික් ටික හොරා ළඟම තැන්පත් කිරීම වැරදිය. ඒ හමු වූ මැණික්මද එහි තිබෙන්නේ විශ්වාසයක් තියෙන්න පුළුවන්ද යන්න සැක සහිත බවය.තියෙන මැණික් වෙන්දේසි කරන්න ඕනෑම අවස්ථාවක පුළුවන් බවත්,ඒ හමු වූ මැණික්ද එතන තිබෙන්නෙ කියල විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතු බවත්,දැනටමත් දෝනා ආදාහනාගාර භූමියට එනවද කියල බැලිය යුතු බවත්ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා පවසා සිටියේ රජයේ ඉඩමකට දෝනාවක් ඇතුල් වීම වැරදි බවත් එයට විරුද්ධව එම කාලයේ නිලධාරීන් හා සභාපතිතුමන් කටයුතු සිදු නොකර ඇති බවයි.ඒ තැන සිට විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුය. මෙම පරීක්ෂණය පොදු දේපළ පනත යටතේ ක්‍රියාත්මක කළ යුතු බවත්,මේ අවස්ථාවේදී මැණික් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය භාරයේ පවතින බැවින් මැණික් වෙන්දේසි කිරීමට හදිසි නොවිය යුතුය.මෙම සභාවේදී තීරණයක් ගත යුතුයි වැරදි තැන සිට පරීක්ෂණ පැවැත්වීමට.සංස්ථාවේ නීතිය අනුව රජයේ ඉඩමකින් ගන්නා ලද ඉල්ලම් එවලේම තහනම් කර භූමියෙන් ඉවත් කළ යුතු බවත් එසේ ක්‍රියාවලියක් සිදු වී නොමැති බව ක්‍රියාවලියක් නොමැතිව හිතුමතේ මැණික් ඉල්ලම් ගරා හමු වූ මැණික් ලයිසන්කරු වෙත ලබා දී ඇති බවත් එසේ සිදු වූයේ කෙසේද යන්න සොයා බැලිය යුතුයි. මෙහි පතල් 04කින් 3ක දෝනා වලින් ඉල්ලම් ගරා ඇති නමුත් ඔවුන්ට විරුද්ධව ක්‍රියාත්මක වීමක් සිදු වී නොමැති බවයි.මෙහි සම්පූර්ණ විස්තර පෞද්ගලිකව දන්නා බවත් සඳහන් කරන ලදි.මෙම නීති විරෝධී වැඩකි.මේ සඳහා නීතියෙන් ගත හැකි උපරිම දඬුවම ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසා සිටියේ සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් යුත් කමිටුවක් සකස් කර නිවැරදි වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවයි. මැණික් ගරපු පුද්ගලයන් පිළිබඳ වාර්තාවක් කමිටුවක් හරහා ලබා ගැනීමට හැකිනම් එය සමාජයට ආදර්ශයක් බවයි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසා සිටියේ සභාපති ලෙස මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ලිපියක් යොමු කරන ලදදේ මෙම ගැටළුව සම්බන්ධයෙන් නිරන්තරයෙන් ලක්වූ නිසාය.විගණනය මගින් මේ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග වල ප්‍රගතිය විමසන බවයි.මැණික් හා ස්වර්ණාභරණ පනතට අනුව කිසියම් බාහිර පුද්ගලයෙක් වෙනත් පුද්ගලයෙකුගේ දේපළ වලට ඇතුල් වී ඛණිජ ලබා ගත්විට තිබෙන ස්වභාවය හා පුද්ගලයෙකුගේ නොවන පොදු දේපළකට ඇතුල් වී ඛණිජ ලබා ගත්විට තිබෙන තත්වය වෙනස් බවයි.පොදු දේපළ පනත යටතේ නඩු පැවරිය හැක. ප්‍රාදේශීය සභාව ලෙස මැණික් ගැරීම මුල් අවස්ථාවේ සිටම මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය දැනුවත් කර ඇති බවත් ඒ අනුව සභාව විසින් නිසි පරිදි නීත්‍යානුකූල මාර්ගයේ ගමන් කර ඇති බවයි.මේ සම්බන්ධව විවිධ අවස්ථා වලදී විගණනයෙන් ප්‍රශ්න කර ඇති බවයි.ඒ අනුව සභාවක් ලෙස මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගත යුතුය.ඒ අනුව මේ සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර සුදුසු ලෙස කටයුතු කරන ලෙස මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ලිඛිතව දන්වන ලදි.මේ සමස්ථ අදහස් වලින් පෙනී යන්නේ මැණික් සංස්ථාවේ ක්‍රියාකාරීත්වය අඩු තත්වයක පවතින බවයි.මේ කටයුත්ත වෙනුවෙන් අවු 05ක් ගොස් ඇති බැවින් මෙහි ක්‍රියාවලිය ඉක්මන් කළ යුතුය.මේ සම්බන්ධයෙන් සාක්ෂි එකතු කර අපරාධ විමර්ශණ දෙපාර්තමේන්තුව හරහා පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි බවයි.

**<u>තීරණ අංක 20</u>**

මෙම ඉඩමෙන් හමු වූ මැණික් ඛණිජ පාෂාණ සම්බන්ධයෙන් අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ගොනු කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවත්, ආරම්භයක් ලෙස අපරාධ සම්බන්ධ විශේෂඥ දැනුම ඇති නීතිඥ වරයෙකුට ගොනුව ඉදිරිපත් කර නඩු කටයුත්තක් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සාක්ෂි ඇත්දැයි පරීක්ෂා කර බලා ලැබෙන වාර්තාව මත ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

21.අධික වර්ෂාව හේතුවෙන් ප්‍රමාද වූ පහත ව්‍යාපෘති සඳහා ගිවිසුම් කාලය 2025.11.30-2025.12.20 දක්වා දීර්ඝ කිරීම සුදුසු බව යෝජනා කරමි.

- වැලිමළුව පිටකුඹුර ග්‍රාමය හරහා ඇතුගල ආරණ්‍ය දක්වා අබලන් මාර්ගය අළුත්වැඩියා කිරීම
- පැල්මඩුල්ල කොම්පෝස්ට් අංගනයේ ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම
- නීලගම සමගි මාවත සංවර්ධනය කිරීම

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 21</u>**

අධික වර්ෂාව හේතුවෙන් ප්‍රමාද වූ ඉහත නම් සඳහන් ව්‍යාපෘති සඳහා ගිවිසුම් කාලය 2025.11.30-2025.12.20 දක්වා දීර්ඝ කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

22. පළාත් පාලන කොමසාරිස්ගේ CLG/LG/07/05/08 හා 2025.11.09 දිනැති ලිපියට අනුව වරකාවත්ත මාදම්පේ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කිරීම.

**<u>තීරණ අංක 22</u>**

ඉහත යෝජනාව පැල්මඩුල්ල බල ප්‍රදේශයට අයත් ව්‍යාපෘතියක් නොවන හෙයින් මෙම යෝජනාව ඉවත් කරන ලදී.

23.ප්‍රධාන අමාත්‍යාංශය හා පැල්මඩුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2025) මගින් ප්‍රතිපාදන වෙන් වී ඇති රු. ලක්ෂ 20ට අඩු පහත ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ප්‍රජා පාදක සංවිධානයක් තෝරා කොන්ත්‍රාත් පැවරීමට යෝජනා කරමි.

| අනු අං. | ව්‍යාපෘතියේ නම | අනුමත ප්‍රතිපාදන (රු.) |
|---|---|---|
| 01 | දිප්පිටිගල ස්ථාලවත්ත මාර්ගයේ කොන්ක්‍රීට් කර නොමැති ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම හා පැති කාණුව ඉදිකිරීම | 973,946.76 |
| 02 | හත්බිලි ඇල්ල ජල ව්‍යාපෘතියේ නළ එළීමේ කොටසක ප්‍රතිසංස්කරණය කිරීම | 1,179,967.87 |
| 03 | ඉහළ බෝපිටිය පාළුවත්ත මාර්ගය ඉදිරියට පිළිසකර කිරීම | 1,919,149.94 |
| 04 | බණ්ඩාරවත්ත දෙනවක යා කරන මාර්ගයේ ආරොන් සිංඤෝ මහතාගේ නිවාස අසල සිට දෙනවක පාතකඩ දක්වා මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම | 1,437,462.39 |
| 05 | ධම්මරක්ඛිත මාවත අමුණ මාර්ගයේ ඉතිරි කොටසේ මාර්ගය සංවර්ධනය කිරීම සහ ඇළ මාර්ගය සංවර්ධනය කිරීම | 967,518.86 |
| 06 | කිරිවැල්දෙණිය පන්සල අසල සිට (මීටර් 250) ඉන් ඉදිරියට ගල් අතුරා තාර දැමීම | 1,441,233.27 |
| 07 | උඩංගොඩ මාර්ගය තාර යොදා සංවර්ධනය කිරීම | 1,968,555.57 |
| 08 | දොඹගස්වින්න සරෝදයට පිවිසෙන මාර්ගයේ සිට ඉදිරියට දොඹගස්වින්න පාසල අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1,945,218.97 |
| 09 | සමනල උයන ප්‍රදේශයට පිවිසුම් මාර්ගයට තාර දැමීම සහ මාර්ගය පැති කාණු යොදා පිළිසකර කිරීම | 1,454,045.90 |
| 10 | පහළ ගම්මැද්ද පිටකුඹුර පාරේ ගිලා බැස ඇති ස්ථානය පැති බැම්මක් යොදා සංවර්ධනය කිරීම | 994,079.67 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ ව්‍යාපෘති කිරීමේදී ගැටලුවක් ඇති බවත්, ව්‍යාපෘති කිරීම සඳහා සමිති කැමති නමුත් ඇස්තමේන්තු සකස් කර ව්‍යාපෘතිය සිදු කර බිල්පත් ඉදිරපත් කර මුදල් ගැනීමට යන කාලය අතිශය ප්‍රමාද බවයි.මෙය නිවැරදි විය යුතුය. ව්‍යාපෘති වලට කොන්ත්‍රාත්කරුවන් සිටින බවත් ඔවුන් ඉදිරිපත් නොවීමට හේතුව වන්නේ මුදල් ලැබීම ප්‍රමාද වීමයි.මෙම ව්‍යාපෘති ඇදි ඇදී යන බවත් මෙම තත්වය නිවැරදි කර ගතහොත් ව්‍යාපෘති ගොඩ දා ගත හැකිය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ කර්මාන්ත පිළිබඳ මීට වඩා විමසිල්ලෙන් කටයුතු කළ යුතු බවත්,සර්වෝදය පාසලට එහා පැත්තෙන් ලක්ෂ 20ක මුදලකට කොන්ක්‍රීට් දැමූ බවත්,මෙහිදී ඇස්තමේන්තු සකස් කිරීමේදී මාර්ගය , ජනතාව ගැන බලන්නැතිව ව්‍යාපෘති සිදු කළ විට මාර්ගය මාසයක් පමණ වසා දැමීම තුළින් ජනතාව අපහසුතාවයට පත් විය.මෙවැනි ස්ථාන වලට ක්ෂණිකව මාර්ගය විවර කළ හැකි පරිදී ව්‍යාපෘති සිදු කළා නම් සාර්ථක බවත්,මෙවැනි ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සැකසීමේදී කරන්නන්වාලේ ඇස්තමේන්තු සකස් නොකර ප්‍රදේශයේ

ජනතාවගේ අදහස් අරගෙන ඇස්තමේන්තු සැකසුවහොත් සාර්ථක බවය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා පවසා සිටියේ මිල ගණන් විවෘත කිරීමේදී සභාවේ කාර්මික නිලධාරීන් මෙයට අත්සන් නොකර පිටව යනවානම් එය ගැටළුකාරී තත්වයකි.එවිට මෙම භාණ්ඩ(විදි පහන්) ප්‍රමාද වීම නිසා මන්ත්‍රීවරුන් ලෙස මහජනතාවට උත්තර දිය යුතු බවයි. ඒ ගැන සැළකිලි මත්වන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා පවසා සිටියේ අප මහජන නියෝජිතයෝ ලෙස කමිටු වලට සහභාගී වන බවත් විෂය දැනුමැති නිලධාරීන් කමිටුවෙන් නැගිට ගිය පසු අපට මුහුණට මුහුණ බලා ගැනීම පමණක් සිදු විය .මෙම කමිටුව සඳහා කාර්මික නිලධාරීතුමෙකු සම්බන්ධ කර දෙන ලෙස ලේකම්තුමාගෙන් ඉල්ලීම් කළ බවත් කාර්මික නිලධාරී ඉරෝෂන් මයා එම අවස්ථාවට සහභාගී විය.මෙවැනි අය ඉදිරියටත් අප සභාවෙන් නඩත්තු කළ යුතුද යන්න ප්‍රශ්නයක් බවයි.තවද කාර්මික නිලධාරී මහතෙක් මහජන සම්බන්ධතා පිලිබඳ අවබෝධයක් ලබා ගත යුතු බවත්,මිනිසුන් ඉදිරියේ හැසිරීම නොදන්නා බවත්,අදහස් ප්‍රකාශ කිරීම අප්‍රිය සහගත බවයි.ආයතනයක් තුලදී ජනතාව අපහසුතාවයට පත්නොවිය යුතුය. කාර්මික නිලධාරී මහතාගේ හැසිරීම පිළිබඳ අප්‍රසාදයක් පළ කරන අතර ඒ සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසා සිටියේ අප සභාවට කාර්මික නිලධාරී තනතුරු දෙකක් පවතින බවත්,නව කාර්මික නිලධාරී මහතා අපට තබා ගැනිමට හැකියාවක් නොමැති බවත් ජයසිංහ මහතා කොන්ත්‍රාත් පදනම මතද? ඉරෝෂන් මහතා ස්ථිර පදනම මතද සේවයේ යෙදෙන බවත් ජයසිංහ මහතාගේ ගිවිසුම් කාළය දීර්ඝ නොකර දෙදෙනාම තබාගත නොහැකි බවත්,මේ කාලය වැඩ අධික කාලයක් බැවින් නවක කාර්මික නිලධාරී මහතා පුහුණු වීමට කාලයක් යන බැවින් අප ජයසිංහ මහතා රදවා ගන්නා ලදි.

කර්මාන්ත වල ගැටළුකාරී තත්වයන් විසඳා ගැනිම සඳහා මෙම ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා ගෙන ආ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.(ප.ව.12.42)

මෙම අවස්ථාවේදී විෂය නිලධාරී මඟින් ව්‍යාපෘති ,ව්‍යාපෘති වල ප්‍රගතිය,බිල් ගෙවීම්,ඇස්තමේන්තු සකස් කිරීම් ආදී ගැටළු පිළිබඳව සාකච්ඡා කරන ලදි.

මෙම කාරක සභාව ගරු මහා සභාව බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා ගෙන ආ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් සථිර කරන ලදි.(ප.ව.12.52)

**<u>තීරණ අංක 23</u>**

ප්‍රධාන අමාත්‍යාංශය හා පැල්මඩුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2025) මගින් ප්‍රතිපාදන වෙන් වී ඇති රු. ලක්ෂ 20ට අඩු පහත ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ප්‍රජා පාදක සංවිධානයක් තෝරා කොන්ත්‍රාත් පැවරීමටත්,මෙම ව්‍යාපෘති වල බිල්පත් පියවීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් සාකච්ඡාවට බඳුන් වූ හෙයින් මෙම ව්‍යාපෘති වල බිල්පත් පියවීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත් කරුවන් හා සම්බන්ධවී මෙම බිල්පත් කඩිනම් කිරීම සඳහා කාර්මික නිලධාරීන් වෙත ලිපි යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

ප.ව.12.53ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා ගරු සභාවෙන් පිටවන ලදි.

**<u>II.ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමාගේ යෝජනා</u>**

01.ඉසුරුගම මැද පාර (මහින්ද මහතාගේ නිවාසය දක්වා ඇති) මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 24</u>**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සහා අරමුදලින් දැරීමට හැකි සංවර්ධනයක් නම් ක්‍රියාත්මක කිරීමටත්,එසේ නොමැතිනම් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

02.හපුරුගල වතු කොටස පල්ලිය අසළින් පහළට ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 25</u>**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සහා අරමුදලින් දැරීමට හැකි සංවර්ධනයක් නම් ක්‍රියාත්මක කිරීමටත්,එසේ නොමැතිනම් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

03.වීදි ලාම්පු සවි කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 26**

ඉදිරියේදී පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් සෑම කොට්ඨාශයකම වීදි පහන් සවි කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

04.පරකැටිය මාර්ගය කොන්ක්‍රීට් කිරීමට (අබේරත්න මහතාගේ නිවස අසළින් ඇති කඳු කොටස) යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 27**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව සහා අරමුදලින් දැරීමට හැකි සංවර්ධනයක් නම් ක්‍රියාත්මක කිරීමටත්,එසේ නොමැතිනම් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

05.නිරල්ගම ජනපදය මාර්ගය දෙපස කම්කරුවන් යොදා එළි පෙහෙළි කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 28**

නිරල්ගම ජනපදය මාර්ගය දෙපස කම්කරුවන් යොදා එළි පෙහෙළි කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**III. ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමාගේ යෝජනා.**

01.අක්කර 50 පොදු නාන පීල්ල ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 29**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව අක්කර 50 පොදු නාන පීල්ල ප්‍රතිසංස්කරණය සහා අරමුදලින් සිදු කිරීමට හැකි නම් සිදු කිරීමටත් එසේ නොමැති නම් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

02.බැරුණ්ඩුව වතු නිවාස වලට අයත් පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 30**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව බැරුණ්ඩුව වතු නිවාස වලට අයත් පොදු ළිඳ ප්‍රතිසංස්කරණය සහා අරමුදලින් සිදු කිරීමට හැකි නම් සිදු කිරීමටත් එසේ නොමැති නම් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

03.ලෙල්ලෝපිටිය හෙට්ටිකන්ද මාර්ගයේ ඇති කාණු ගොඩදැමීම සඳහා අදාළ ආයතන දැනුවත් කිරීමට යෝජනා කරමි.
ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 31**

ලෙල්ලෝපිටිය හෙට්ටිකන්ද මාර්ගයේ ඇති කාණු ගොඩදැමීම සඳහා අදාළ ආයතන දැනුවත් කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

04.ගල්අස්සාපොළ මාර්ගයේ අතුරු මාර්ගයක් වන කේ.කේ.හේමචන්ද්‍ර මහතාගේ නිවසට සහ තවත් නිවාස කිහිපයක් සඳහා යන මාර්ගයේ ඇති බෝක්කුව සිලින්ඩරයක් යොදා ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 32**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ගල්අස්සාපොළ මාර්ගයේ අතුරු මාර්ගයක් වන කේ.කේ.හේමචන්ද්‍ර මහතාගේ නිවසට සහ තවත් නිවාස කිහිපයක් සඳහා යන මාර්ගයේ ඇති බෝක්කුව සිලින්ඩරයක් යොදා ප්‍රතිසංස්කරණය සහා අරමුදලින් සිදු කිරීමට හැකි නම් සිදු කිරීමටත් එසේ නොමැති නම් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

**IV. ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමාගේ යෝජනා.**

01.කුට්ටාපිටිය කොට්ඨාශයේ කුට්ටාපිටිය වසමේ පැල්මඩුල්ල කුට්ටාපිටිය මාර්ගයේ රිවස් වංගුවට පහළින් ඇති කොටස යම් කිසි ගිලා බැසීමකට ලක්ව ඇත.මෙය පළාත් සභාවෙන් නඩත්තු වන මාර්ගයකි.ඉතා ඉක්මනින් මෙම ස්ථානයට පැති බැම්මක් යොදා එම ස්ථානය ආරක්ෂා කළ යුතු වේ. නැතිනම් මාර්ගය ගැලවීයාමේ අවධානමක් පවතී. විකල්ප මාර්ග නොමැති බැවින් මේ පිළිබඳව අවධානය යොමු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 33**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව මෙම යෝජනාව අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව

ඒකමතිකව සහා සම්මත විය.

02. නාරංගොඩ දිලෙන තරු ක්‍රීඩා සමාජයේ වොලිබෝල් ක්‍රීඩා පිටියට රාත්‍රියේ ක්‍රීඩා කිරීමට හැකි ලෙස විදුලි බල්බ 04ක් ලබා දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 34</u>**

ප්‍රතිපාදන තත්වය සළකා බලා නාරංගොඩ දිලෙන තරු ක්‍රීඩා සමාජයේ වොලිබෝල් ක්‍රීඩා පිටියට රාත්‍රියේ ක්‍රීඩා කිරීමට හැකි ලෙස විදුලි බල්බ 04ක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

03. කුට්ටපිටිය වසමේ පොල්ගස්වත්ත උඩපාර අධික ලෙස ඛාදනයට ලක්ව ඇත. ඔවුන් ඉල්ලන්නේ බැකෝ යන්ත්‍රයක් භාවිතයෙන් එම මාර්ගය පිළිසකර කර දෙන ලෙස යෝජනා කරමි.(එම මෙහි පවුල් 15ක් පමණ ජීවත් වන අතර විශාල තේ වතු ඉඩම්ද ඇත)

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 35</u>**

කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව බැකෝ යන්ත්‍රය යොදා මාර්ගය පිළිසකර කිරීමට හැකිනම් කුට්ටපිටිය වසමේ පොල්ගස්වත්ත උඩපාර බැකෝ යන්ත්‍රය භාවිතයෙන් පිළිසකර කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**හදිසි යෝජනා.**

**<u>ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.</u>**

01.2025 වර්ෂයේ පළාත් මාර්ග සංවර්ධන ,ග්‍රාමීය යටිතල පහසුකම් ,ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් ග්‍රාමීය යටිතල පහසුකම් සංවකය යටතේ ප්‍රතිපාදන වෙන්ව ක්‍රියාත්මක කරන ලද වැලිමළුව ගමට පිවිසෙන දොඩම්ගම ඇල මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.1,712,409.02 ක මුදල කොන්ත්‍රාත්කරු වන වැලිමළුව ගොවි සංවිධානය වෙත නිදහස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා කේ.සුසන්ත ප්‍රේමකුමාර මන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 36</u>**

2025 වර්ෂයේ පළාත් මාර්ග සංවර්ධන ,ග්‍රාමීය යටිතල පහසුකම් ,ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් ග්‍රාමීය යටිතල පහසුකම් සංවකය යටතේ ප්‍රතිපාදන වෙන්ව ක්‍රියාත්මක කරන ලද වැලිමළුව ගමට පිවිසෙන දොඩම්ගම ඇල මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.1,712,409.02 ක මුදල කොන්ත්‍රාත්කරු වන වැලිමළුව ගොවි සංවිධානය වෙත නිදහස් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

02.පළාත් මාර්ග සංවර්ධන ,ග්‍රාමීය යටිතල පහසුකම්,ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් ග්‍රාමීය යටිතල පහසුකම් පරිපූරක V සංවරකය යටතේ පහත සඳහන් ව්‍යාපෘති ප්‍රසම්පාද මාර්ගෝපදේශ සංග්‍රහය පරිදී සුදුසු ප්‍රජා පාදක සමිතියක් තෝරා ගිවිසුම්ගතව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

I. ගෝණකුඹුර හංදියේ ඇතුගල දක්වා මාර්ගය ඉදිකිරීම - රු.1,924,378.94
II. මොරතොට කොළණිය මාර්ගයේ සිට වමින්ද මහතාගේ නිවස අසළ සිට සොහොන් පිටිය අසළ බෝක්කුව ඉදි කිරීම - රු.1,881,669.70
III. ගනේගම හංදියේ සිට රිල්හේන වත්තට යන මාර්ගයේ අත්‍යවශ්‍ය කොටස් තාර දැමීම - රු.1,181,791.34

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 37</u>**

ඉහත සඳහන් ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ප්‍රජා පාදක සංවිධානයක් තෝරා කොන්ත්‍රාත් පැවරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

03.දිට්වා සුළිකුණාටුව හේතුවෙන් ආපදාවට පත් ජනතාවට පිසූ ආහාර ලබා දීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනිම වෙනුවෙන් බිල්පත් පියවීම සම්බන්ධයෙන් පැල්මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් එකඟතාවය පළ කර ඇත.නමුත් එම පියවීම් සිදු නොකළහොත් සභා අරමුදලින් මෙම බිල්පත් ගෙවීම සඳහා සභා අනුමැතියට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 38</u>**

දිට්වා සුළිකුණාටුව හේතුවෙන් ආපදාවට පත් ජනතාවට පිසූ ආහාර ලබා දීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනිම වෙනුවෙන් බිල්පත් පියවීම පැල්මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් සිදු නොකළහොත් සභා අරමුදලින් මෙම බිල්පත් ගෙවීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමාගේ යෝජනා.</u>**

01.පැල්මඩුල්ල කාමරංගපිටිය ඒ.කේ.හර්ෂණී මධුෂිකා යන අයගේ නිවස අසළ ප්‍රධාන මාර්ගයේ ඉවුරු පසුගිය වැහි කාලයේ

කඩා වැටීමකට ලක්ව ඇත.මෙය අනතුරුදායක බැවින් අනතුර වළක්වා ගැනිමට මාර්ග සංවර්ධන අධිකාරී සමඟ සාකච්ඡා කර බැම්මක් ඉදිකර දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා පවසා සිටියේ මෙම ස්ථානයේ බැම්මක් ඉදි කිරීමට අප සභාවට හැකියාවක් නොමැති බැවින් මාර්ග සංවර්ධන අධිකාරී සමඟ සාකච්ඡා කර බැම්මක් ඉදිකර අනතුර අවම කර ගැනීම සඳහා බැම්මක් ඉදි කිරීමට කටයුතු සැළසීම සුදුසු බවය.

**<u>තීරණ අංක 39</u>**

මෙම යෝජනාව සම්බන්ධයෙන් අදාළ ආයතන වෙත දන්වා යැවීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ශ්‍රියානි වීරසේකර මැතිතුමියගේ යෝජනා.</u>**

01.පාතකඩ තුබදෙණිය මාර්ගයේ සිට ගොඩගමට පිවිසෙන මාර්ගය වානක මහතාගේ නිවස අසළ ගල් අමුණ වේල්ල හරහා දමා ඇති බෝක්කු සහිත මාර්ග කොටස පැවති වර්ෂාව හේතුවෙන් කැඩී ගොස් ඇති හෙයින් වාහන ගමනාගමනයට බාධා පැමිණ ඇත.මෙම මාර්හය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 40</u>**

කාර්මික නිලධාරී පරීක්ෂණයක් සිදු කර මෙම යෝජනාව සම්බන්ධයෙන් අදාළ ආයතන වෙත දැනුම් දිම සුදුසු බවට ඒතමතිකව සහා සම්මත විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.රුවන් වානක පියරත්න මැතිතුමාගේ යෝජනා.</u>**

01.අලුපොත සිට රත්නපුර දක්වා ඇති ප්‍රධාන මාර්ගය යාබදව පිහිටා ඇති හපුරුගල,මැදවත්ත,පේරතැන්න,කලුගල්තැන්න,අරබෙගෙවත්ත යන ගම් වල පවුල් 100ක් පමණ දිවිගෙවන අතර,අයහපත් කාළගුණික තත්වය මත එම නිවාස ඉරිතලා ඇති බවත්,අලුපොත රත්නපුර ප්‍රධාන මාර්ගයේ හපුරුගල මැදවත්ත මාර්ගය මේ වන විට ගිලා බැසීමකට පත්වී අති බවත්,භූ විද්‍යා හා පතල් කාර්යාංශය මඟින් 1994/02/10දින සමීක්ෂණ වාර්තාවකින් මෙම ප්‍රදේශය නාය යන බවට අනතුරු අඟවා ඇත. මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.රුවන් වානක පියරත්න මැතිතුමා විසින් පවසා සිටියේ 1994,1982,1989 කාල වලදී මෙම කඳු ප්‍රදේශයේ පැලුම් ඉරි මතු වී නිවාස පැළී,භූමි ප්‍රදේශ ගිලා බැසීමකට ලක්වී ඇති බවත්,අධික වර්ෂාව හේතුවෙන් හපුරුගල පේරතැන්න මැදවත්ත කොටස ගිලා බැසීමකට ලක්වී ඇත.අලුතින් සාදන ලද නිවාස පවා පැලීමකට ලක්ව ඇත.මෙම ප්‍රදේශය 1994 ,1993 කාල වල දිසාපතිවරු එම ප්‍රදේශයේ අනවසර කැණීම් සම්බන්ධව ලිඛිතව අදාල පුද්ගලයන් දැනුවත් කර එම බලපත්‍ර තාවකාලිකව නවතා ඇත.පසු ගිය වර්ෂවලද මෙම කටයුතු සිදු වූ අවස්ථා වල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෝමරත්න මන්ත්‍රී ඇතුළු පිරිස විසින් නතර කරනු ලැබීය.වර්තමානයේ නිරීක්ෂණ පතල් වශයෙන් බලපත්‍ර ලබා දී කැණීම් සිදු කිරීම දිගටම සිදු කරන බවත්ය.මේ ගම තුල පවුල් 100ට වඩා ප්‍රමාණයක් ජීවත් වන අතර මොවුන් දැඩි අවධානමකට ලක් වි ඇති ඇත.මෙම නිවෙස් පැලීමකට ලක්වීම ,බොර ජලය ගලා යාම,දිය බුබුළු මතු වීම යන විපර්යාසයන් සිදු වී ඇති බවයි.මෙම ප්‍රදේශ පිළිබඳ අවධානයක් යොමු කර ජනතාවට සාධාරණයක් සිදු කරන ලෙස ඉල්ලා සිටිමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා ප.ව.1.56ට ගරු සභාවෙන් පිටවන ලදි.

**<u>තීරණ අංක 41</u>**

කාර්මික නිලධාරී පරීක්ෂණයක් සිදු කර මෙම යෝජනාව සම්බන්ධයෙන් අදාළ ආයතන වෙත දැනුම් දිම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා ප.ව.2.00ට ගරු සභාවෙන් පිටවන ලදි.

**07.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

2025.12.01පැවති කාර්මික හා සේවා කමිටු රැස්වීම් වාර්තාව,2025.11.20දිනපැවති පුස්තකාල උපදේශන කමිටු වාර්තාව සභාගත කරන ලදි.

**08.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා ගරු සභාවට ඉදිරිපත් කිරීම.**

2025.10.01 සිට 2025.10.31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව සභා ගත කරන ලදි.

විගණන අධිකාරිය විසින් 2025.10.10 දිනැතිව එවන ලද SGLG/RT/B/PMPS/5/2025 අංක දරණ මූල්‍යය කාර්යය සාධන විගණන වාර්තාව SGLG/RT/B/PMPS/5/2025/AQ/07 අංක දරන 2025.10.10 දිනැති මූල්‍යය කාර්යය සාධන විගණන වාර්තාව සභාගත කරන ලදි.

පැලමඩුල්ල ප්‍රාදේශීය සභාව අභ්‍යන්තර විගණන ඒකකය විසින් PEL/PS/ACC09 හා 2025.10.17 වන දිනැති 2025 ඔක්තෝම්බර් මස අභ්‍යන්තර විගණන වාර්තාව සභාගත කරන ලදි.

**වෙනත් කරුණු**

- **සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්.**
- **සභාපතිතුමාගේ ස්තුති කිරීම.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උප සභාපතිතුමන් ගරු විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

- ප.ව.2.30ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

ගරු ප්‍රාදේශීය සභා ..................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ......................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථීරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2026-01-14 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව